**එම්. යූ. එම්. අලි සබ්රි,** පා. ම.
எம். யூ. எம். அலி ஸப்ரி, பா. உ.
**M. U. M. Ali Sabry,** PC, M.P.
**විදේශ කටයුතු අමාත්‍ය**
வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்
**Minister of Foreign Affairs**

2024 ජනවාරි 01

## 2024 නව අවුරුදු සුභ පැතුම් පණිවිඩය

අප සියලුදෙනාම අභියෝගාත්මක වසරකට සමුදෙන අතර අලුත් අවුරුද්දක උදාව සාදරයෙන් පිළිගනිද්දී මා අනාගතය ගැන ප්‍රවේශමෙන් සුබවාදීව සිතමි. අති දුශ්කර කාල පරිච්ඡේදයක් අපි අත්විඳ ඇත්තෙමු, එමා කාලවකවානුවේදී මෙරට ජනතාවගේ කැපී පෙනෙන ඔරොත්තු දීමේ හැකියාව සහ ශක්තිය ද අපි දැක ඇත්තෙමු. එක්ව, අපට ඕනෑම බාධකයක් ජයගැනීමට හැකි බවට විශ්වාසයක් ලබා දෙන්නේ මෙම ඔරොත්තු දීමේ හැකියාවයි.

පසුගිය වසර කිහිපය තුළ අප විවිධ අභියෝගවලට මුහුණ දුන් නමුත් දුෂ්කරතා මධ්‍යයේ වුවද දීප්තිමත් හෙට දිනක් දුටුවෙමු. ශක්තිමත් සහ සමෘද්ධිමත් ජාතියක් යළි ගොඩනැගීම සඳහා ශ්‍රී ලාංකිකයන්ගේ අධිෂ්ඨානය සහ කැපවීම මම අගය කරමි.

අර්ථවත් ප්‍රතිසංස්කරණ සහ යථාර්ථවාදී ප්‍රතිපත්ති සඳහා අප කැපවිය යුතුය. මේ සඳහා සමාජයේ සෑම අංශයකින්ම, විශේෂයෙන් රජය, රාජ්‍ය සේවය, ව්‍යාපාරිකයන්, සිවිල් සමාජය සහ තනි පුද්ගලයන්ගෙන් සාමූහික උත්සාහයක් අත්‍යවශ්‍ය වේ. මෙම ප්‍රයත්නය ක්‍රමානුකූලව මෙරට තුළ තිරසාර වර්ධනයක් සහ සමෘද්ධිමත් වටපිටාවක් නිර්මාණය කිරීමයි.

අපගේ සාමූහික සාර්ථකත්වයේ ප්‍රධාන අංගයක් වන්නේ විවිධත්වය වැළඳ ගැනීමට අපට ඇති හැකියාවයි. ශ්‍රී ලංකාවේ පොහොසත් සංස්කෘතික උරුමයන් රැකගනිමින් සහ මෙරට සමාජයේ විවිධත්වය නියෝජනය කරන විවිධ දෘෂ්ටිකෝණ, කුසලතා සහ අදහස් උපයෝගී කර ගැනීම අපව වඩාත් හොඳින් ස්ථානගත කරයි. විවිධත්වය අගය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම මගින්, අපි වඩාත් සුහද සමාජයක් ගොඩනගනවා පමණක් නොව, ශ්‍රී ලාංකිකයන් පූර්ණ හැකියාවන් ද ලොවට විවෘත කරන්නෙමු.

එළැඹෙන වසර තුළ, එකමුතුකම, අවබෝධය සහ ගෞරවය සඳහා අපගේ කැපවීම සාක්ෂාත් කරමු. බෙදීමේ මූලාශ්‍රයක් වෙනුවට විවිධත්වය ශක්තියක් ලෙස වැළඳ ගනිමු.

අපි 2024 වර්ශය ආරම්භ කරන විට එක්ව, වෙන්ස්කම් අභිබවා අධිෂ්ඨානශීලීව සහ ශුභවාදීව ඉදිරියට යමින් ලක් මාතාව සෞභාග්‍යයේ ආලෝකයක් බවට පත් කිරීමට එක් වෙමු.

ඔබ සැමට සුබ නව වසරක් වේවා.

ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විදේශ කටයුතු අමාත්‍ය

කාර්යාලය/அலுவலகம்/Office: +94 - 11-2430221, +94-11-2445498 ෆැක්ස්/பெக்ஸ்/Fax No.: +94-11-2430222
වෙබ් අඩවිය/வலைத்தளம்/Website : www.mfa.gov.lk ඊමේල්/மின்னஞ்சல்/Email: fmo@mfa.gov.lk
විදේශ කටයුතු අමාත්‍යාංශය, ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 01, ශ්‍රී ලංකාව.
வெளிநாட்டு அலுவல்கள் அமைச்சு, குடியரசுக் கட்டிடம், கொழும்பு 01, இலங்கை.
Ministry of Foreign Affairs, Republic Building, Colombo 01, Sri Lanka.